RÉPUBLIQUE
FRANÇAISE

*Liberté*
*Égalité*
*Fraternité*

**වධාත්ම දරුණු ගණයේ ජාත්‍යන්තර අපරාධ වලට අදාළ අධිකරණ වලින් දඬුවම් නොපැමිනීමට විරුද්ධව ගෙන යන අරගලය තුළදී, එම අපරාධ වලට විරුද්ධව පියවර ගැනීමට ප්‍රංශ අධිකරණයට බලතල ඇත.**

සිවිල් ජනතාව මර්දනය කිරීමේදී හෝ ගැටුම් තත්ත්වයක් තුළ දී සිදු කරන ලද බරපතල අපරාධ සහ ප්‍රචණ්ඩ ක්‍රියා වර්ග කීපයක් පිළිබඳ විමර්ශනය කිරීමට **යම් කොන්දේසි** මත **(විශේෂයෙන් අදාළ චූදිතයා ප්‍රංශයේ සිටී නම් හෝ ඔහු හෝ ඇය ප්‍රංශ ජාතිකයකු නම්)** ප්‍රංශයට හැකියාවක් ඇත.

විශේෂයෙන්ම ප්‍රංශ දණ්ඩ නීති සංග්‍රහයේ ඇති පහත සඳහන් **අපරාධ** එම අතරට අයත් වේ.

- **වධහිංසා** පැමිණවීම.
- රජයේ අනුග්‍රහය (අවසරය) ඇතිව හෝ රජයේ නියෝගය මත පුද්ගලයින් අත්අඩංගුවට ගැනීමෙන් හෝ පැහැර ගැනීමෙන් **පසුව අතුරුදහන් වීම**.
- **ඝාතනය** වැනි ජීවිතයට හානි වන ආකාරයේ ක්‍රියා.
- යම් පුද්ගල කණ්ඩායම් **සමූල ඝාතනය කිරීම**.
- **වහල්භාවයේ** තබාගැනීම.
- **ලිංගික අපයෝජනය**, අපරාධ හා ප්‍රචණ්ඩ ක්‍රියා.

ඒ ආකාරයටම **යුදමය තත්ත්වයකදී පවා**

- **සිවිල් ජනතාවට** සහ **දේපල** වලට එරෙහි එල්ලකරන ලද **ප්‍රහාර.**
- ගම් සහ නගර **මංකොල්ලකෑම.**
- ඕනෑකමින්ම සිවිල් ජනතාව **සාගින්නේ තැබීම** හෝ ඔවුන්ගේ **ජීවන මාර්ග අහිමි කිරීම.**
- සිවිල් ජනගහනයෙන් කොටසක් **පිටුවහල් කිරීම** හෝ පදිංචි ප්‍රදේශ බලෙන් මාරු කිරීම.
- **ළමා සොල්දාදුවන්** බඳවා ගැනීම හෝ භාවිතා කිරීම.
- **සෞඛ්‍ය නිලධාරීන්ට** ඔවුන්ගේ උපකරණ ගොඩනැගිලි වලට **පහර දීම්**, උදාහරණයක් ලෙස රෝහල් වලට, **හෙද** කාර්ය මණ්ඩලයට, **ගිලන්රථ** වලට සහ **තුවාල කරුවන්ට** පහර දීම.
- **මානුෂීය මෙහෙයුම්** වල යෙදෙන සංවිධාන වල **සේවකයින්ට** සහ ඔවුන්ගේ **උපකරණ වලට පහර දීම.**
- **ඓතිහාසික ස්මාරක** වැනි **සංස්කෘතික දේපල** වලට එරෙහි ප්‍රහාර.
- **වස, වස සහිත ආයුද**, විෂ හෝ **හුස්ම හිර කරන වායුන්** භාවිතය.

**ඔබ** මෙම අපරාධ වලින් එකක **සාක්ෂිකරුවෙකු හෝ වින්දිතයෙකු** වී ඇත්නම් හෝ **එවැනි අපරාධයක්** කළ හෝ ඊට **අනුබල ආධාර** දුන් **ප්‍රංශයේ පදිංචිව සිටින** හෝ **ප්‍රංශ ජාතිකත්වය** ඇති පුද්ගලයන් පිළිබඳව **තොරතුරු** ඔබ සතුව ඇත්නම්, ඔබට එම තොරතුරු ඔබගේ සම්පූර්ණ සම්බන්ධතා **තොරතුරු සහිත ලිපියකින්** පහත සඳහන් **රජයේ නීතිපතිවරයාට (නඩු පවරන්නට)** යැවිය හැක.

රජයේ නීති පති ලිපිනය

**Tribunal de Grande Instance de Paris**
**Parvis du tribunal -Section AC5**
**75859 Paris Cedex 17**

ප්‍රංශ අපරාධ නඩු විධාන සංග්‍රහයට අනුව ඔබේ අනන්‍යතාවය ආරක්ෂා කිරීමට (යාන්ත්‍රණය) විධිවිධාන කීපයක් ක්‍රියාවට යෙදිය හැක.